මැණික් සහ ස්වර්ණාභරණ අපනයනය


ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
නො. 260, ලේක් ඩ්‍රයිව්, කොළඹ 05.
www.ngja.gov.lk
info@ngja.gov.lk

මැණික් සහ ස්වර්ණාභරණ අපනයනයේ දී අනුගමනය කළ යුතු කරුණු

- ✓ සියලුම මැණික් සහ ස්වර්ණාභරණ අපනයනයන් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අපනයන අංශයන් මඟින් පමණක් සිදුකළ යුතුය.
- ✓ අපනයනය කරනු ලබන මැණික් සහ ස්වර්ණාභරණ අයිතමයන් හෝ අයිතම් තොගය, අපනයනරු විසින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ මැණික් අපනයන මධ්‍යස්ථානයන් , වෙත භෞතිකව රැගෙන ඒ යුතුය.
- ✓ අපනයනය කිරීමට නියමිත භාණ්ඩවල වටිනාකම ආවරණය වන පරිදි මැණික් වෙළෙඳ බලපත්‍රයක් තිබීය යුතුය. (ඕනෑම අවස්ථාවක තමා සතු උපරිම මැණික් හෝ ස්වර්ණාභරණ තොගය මත පදනම් ව මැණික් අලෙවි බලපත්‍රය ලබාගත හැක)
- ✓ අපනයනය කරනු ලබන මැණික් හෝ ස්වර්ණාභරණ තොගය සඳහා අපනයන ඉන්වොයිසියක් ඉදිරිපත් කළ යුතු ය.
- ✓ අපනයන සේවා අංශ සියලු වැඩ කරන දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා සේවාව ලබා දෙන අතර පස්වරු 4 න් පසු ඉදිරිපත් කරන අපනයන පරිසල් සඳහා ප්‍රමාද සේවා ගාස්තුවක් අය කරනු ලැබේ. තවද, පස්වරු 5න් පසු අපනයන පාර්සල් බාරගනු නොලැබේ.


කොළඹ
අපනයන
කාර්යාලය
අපනයනය
මධ්‍යස්ථානය
අපනයන
සේවාව
ලබාදෙනු
ලබන
මධ්‍යස්ථාන
රත්නපුර
දෙමුවාවත
මැණික් කුළුණ
අපනයනය
මධ්‍යස්ථානය
කටුනායක ගුවන්
තොටුපළ කාගේ
විලේජ් පරිශ්‍රයේ
ඇති අපනයනය
මධ්‍යස්ථානය

මැණික් සහ ස්වර්ණාභරණ අපනයනය සේවාව - One Stop Center



අපනයන අංශය විසින් ලබාදෙනු ලබන සේවාවන්

- මැණික්/ ස්වර්ණාභරණ අපනයනය සඳහා පහසුකම් සැලසීම (PGE/PJE)
- තොග පදනම මත මැණික් හා ස්වර්ණාභරණ අපනයනය සඳහා පහසුකම් සැලසීම (PCGE/PCJE)
- සේවා ගාස්තු සහන මත පදනම්ව - Service Fee Waiver
  - ජාත්‍යන්තර මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රදර්ශන සඳහා මැණික් / ස්වර්ණාභරණ අපනයනය සඳහා පහසුකම් සැලසීම - ප්‍රදර්ශන කාණ්ඩය (EXG/EXJ)
  - පුද්ගලික මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රදර්ශන සඳහා මැණික් සහ ස්වර්ණාභරණ අපනයනය සඳහා පහසුකම් සැලසීම – ආදර්ශන කාණ්ඩය (EXG – D/ EXJ – D)
  - ජාත්‍යන්තර රසායනාගාර වාර්තා ලබාගැනීම සඳහා වූ අපනයනයන් සඳහා පහසුකම් සැලසීම (PCGE – T)

අපනයනය සඳහා අවශ්‍ය ලියකියවිලි

- Tax Identification Number (TIN) සහ Value Added Tax අංකය ලබාගෙන තිබීම අනිවාර්යය වේ. ශ්‍රී ලංකා රේගුවේ Asychdha පද්ධතියේ ලියාපදිංචි වී තිබීම ද අනිවාර්යය වේ.

- ශ්‍රී ලංකා රේගුවේ Asychdha පද්ධතිය මඟින් ඉදිරිපත් කරනු ලබන ශ්‍රී ලංකා රේගුවේ ප්‍රකාශිත පත්‍රය (Sri Lanka Custom Declaration) සමඟ පිටපත් අටක (08) කින් යුත් වාණිජ ඉන්වොයිසිය අපනයන අංශය වෙත අපනයන අයිතම සමඟ ඉදිරිපත් කළ යුතුය .

- මෙම පිටපත් පහත පරිදි වේ.
  - අපනයන අංශය - මුල් පිටපත
  - ශ්‍රී ලංකා රේගුව - 2 වැනි පිටපත
  - අධිකාරියේ සංඛ්‍යාලේඛන අංශය - 3 වැනි පිටපත
  - අපනයන සේවා ගාස්තු ගෙවීම සඳහා භාවිත කළ යුතු පිටපත - 4 වන පිටපත
  - ශ්‍රී ලංකා රේගුවේ සංඛ්‍යාලේඛන අංශය -5 වැනි පිටපත
  - 6 - 8 පිටපත් අපනයනකරු වෙත මුද්‍රා තබා නිකුත් කෙරේ. ඒවා ගුවන් තැපෑල / ගුවන් භාණ්ඩ ප්‍රවාහන ආයතනය සඳහා, G. S. P. සහතිකය, “Carnet” සහතිකය, රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට සහ අපනයනකරු විසින් රඳවා ගත යුතු පිටපතක් සඳහා භාවිත කෙරේ.

අපනයන ඉන්වොයිසියේ පහත විස්තර දැක්විය යුතුය

- අපනයනකරුගේ නම සහ ලිපිනය
- අපනයන පාර්සල් ලාභියාගේ නම සහ ලිපිනය
- අපනයන පාර්සල් ලාභියාගේ බැංකු ලිපිනය (අවශ්‍ය නම්)
- ගෙවීම් කිරීමේ මාධ්‍ය
- අපනයනය කරනු ලබන දිනය සඳහා අදාල වන විදේශ විනිමය අනුපාතිකය
- අපනයන පාර්සලය අතේ ගෙන යනු ලබන්නේ නම්, ධාරකයාගේ නම සහ විදේශ ගමන් බලපත්‍රයේ අංකය
- නැවිගත කල දිනය
- ගුවන්යානයේ අංකය

අපනයන ඉන්වොයිසිය සකස් කිරීම

- ✓ අපනයනකරුගේ ලිපි ශීර්ෂය සහිතව විධිමත්ව සහ පැහැදිලිව මුද්‍රිතව ඉදිරිපත් කළ යුතු ය.
- ✓ මුද්‍රිත ඉන්වොයිසිය සඳහා අතින් වෙනස් කිරීම් සිදු නොකළ යුතුය.
- ✓ අපනයන ඉන්වොයිසිවල අධිකාරියේ බලපත්‍ර අංකය සහ අධිකාරියේ ගොනු අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.
- ✓ අපනයන ඉන්වොයිසියේ අපනයනය අයිතමයන්ගේ /තොගයේ F.O.B වටිනාකම (සම්පූර්ණ නැව්ගත විටිනාකම) දැක්විය යුතුය.
- ✓ තැපැල් දෙපාර්තමේන්තුව/ කුරියර් හරහා තම අපනයන පාර්සලය යැවීමට අපේක්ෂිත අපනයනකරුවන් විසින් C.I.F / C & F වටිනාකම ඉන්වොයිසිවල සඳහන් කළ යුතුය.
- ✓ ඉන්වොයිසියේ මැණික් ගල්වල බර කැරට් (Ct.) වලින් දැක්විය විය යුතු අතර ස්වර්ණාභරණ සඳහා අයිතම වල බර ග්‍රෑම්වලින් ද, ලෝහයේ ප්‍රමිතිය කැරට් (Kt.) වලින්ද දැක්විය යුතුය. තවදුරටත් ස්වර්ණාභරණ අයිතම ගණන ද සඳහන් කළ යුතුය.
- ✓ අපනයන දිනයට අදාළ ප්‍රකාශිත විදේශ විනිමය අනුපාතිකය (ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ විදේශ විනිමය අනුපාතිකය අනුව) ඉන්වොයිසියේ පැහැදිලිව සඳහන් කළ යුතුය.
- ✓ අපනයන තොගය ඉන්වොයිසියේ ඇතුළත් අයිතම සඳහා අදාළ වන සාමාන්‍ය දේශීය වෙළඳපල අගයන් පෙන්නුම් කළ යුතුය - උඟණ අගයක් සහිතව / වැඩි වටිනාකමක් සහිතව මැණික් සහ ස්වර්ණාභරණ පාර්සල් අපනයනය කිරීමේ දී අධිකාරියේ සහ ශ්‍රී ලංකා රේගුවේ තක්සේරුකරු නිලධාරීන්ගේ එකඟතාවය මත පමණක් අවසර ලබාදේ.

රේගු ප්‍රකාශන පත්‍රිකාව - Sri Lanka Customs Declaration

අපනයනයට අදාලව, අපනයනකරු විසින් රේගු ප්‍රකාශන පත්‍රිකාව (Custom Declaration)ආසිකුඩා පද්ධතිය මඟින් ඉදිරිපත් කළ යුතු ය. මේ සඳහා ශ්‍රී ලංකා රේගුවේ ලියාපදිංචි වාප්පු ලිපිකරුවකුගේ සහාය ලබා ගත හැකිය. (මේ සේවාව සඳහා ගාස්තුවක් අයකරනු ලැබේ)

ඉන්වොයිසියේ ආකෘතිය - මැණික් සඳහා

- මැණික් අපනයනයේ දී එක් අයිතමයක් බර කැරට් 1 ට වඩා අඩු නම් අදාළ තොගය Lots වශයෙන් දැක්වීම සඳහා අනුමැතිය ලබාදේ.
- ප්‍රමාණයන් තොග වශයෙන් ඉදිරිපත් කිරීමේදී එය සමාන මැණික් වර්ගවලින් තිබීම සහ සමාන ප්‍රමාණයෙන්/කැරට් වශයෙන් ඉදිරිපත් කල යුතුය.
- Cts 10 ට වැඩි සියලුම වටිනා මැණික් වර්ග අධිකාරියේ මැණික් රසායනාගාරය වෙත ඉදිරිපත් කර විස්තරාත්මක වාර්තාවක් ලබා ගත යුතුය. ආපසු පැමිණෙන මැණික් හඳුනා ගැනීම සඳහා මෙම පියවර අවශ්‍ය වේ.

Appendix 1

Specimen Invoice (By Registered Air Mail)

Exporter :	**Name & Address**			**Date**	
(In case of a Private individual)			**Consignee : Name & Address**		
			Tele No.		
Terms : Consignment Basis / Advance Payment			**No. of Pkgs. : 01 (one)**		
Price : C.I.F.					
Delivery : Registered Air Mail					
Item No.	**Description**	**No. of PCS**	**Weight Grams**	**Rate per PC**	**Amt. in USD**
1.	Silver Rings W/S, S/Sapphire, B/Sapphire	09 Pcs	54.530	21.1111	190.00
2.	Silver Rings W/S, Cat's Eyes	04 Pcs	12.350	5.0000	20.00
3.	Silver Rings W/S, Blue, White, Yellow Sapphire, Garnet, Ruby, Nawaratne	12 Pcs	43.350	16.000	192.00
4.	Silver Rings W/S, Amethysts	08 Pcs	44.350	7.000	60.00
5.	Silver Rings W/S, Blue Topaz	06 Pcs	28.100	6.667	40.00
6.	Silver Rings W/S, Moonstone	08 Pcs	52.800	6.000	40.00
7.	Silver Pendent W/S, B/Topaz, M/Stones, Citrene, P/Sapp, Tourmaline	14 Pcs	23.550	5.000	70.00
		61 Pcs	**259.030**		**612.00**

F.O.B. Value	In USD : 612.00 x 150.00	Rs. 91,800.00	
Insurance	In USD 5.00	Rs. 750,00	
Postage	In USD 10.00	Rs. 1,500.00	
CIF Value	**In USD 627.00**	**Rs. 94,050.00**	
			Signature
			Name
			NIC No.

Specimen Invoice (Personally Carried)

Name & Address of Consignee:			**Date:**	
	Terms : Consignment Basis / Advance Payment			
Tel No.				
Delivery: To be taken personally by Mr……. Holding…… Passport No….				

Item No	Description	No of Pcs	Weight cts	Rate per cts – US$	Amount US$ - FOB
1	Blue Sapphire	25 Pcs	96.00	598.333	57,440.00
2	Pink Sapphire	14 Pcs	33.81	428.867	14,500.00
3	Yellow Sapphire	05 Pcs	30.30	319.966	9,695.00
4	Violet Sapphire	03 Pcs	14.86	245.625	3,650.00
5	White Sapphire	02 Pcs	18.38	143.634	2,640.00
6	Alexendrite	01 Pc	2.74	1,094.890	3,000.00
7	Semi-Precious (Aquamarine, Tourmaline, Tanzanite, Zircon)	01 Lot	42.65	2.930	125.00
		01 Lot 50 Pcs	238.74		91,050.00

F.O.B. Value USD 91,050.00 x Rs.150.00 SL Rs. 13,657,500.00

Signature of the Company Director
Company Rubber Stamp

Date

Invoice No.

Name & Address of Consignee:

No of Pkgs 01 (one) **Price :** C.I.F. **Country of Origin :** Sri Lanka

Shipment : Air Freight **Terms :** Consignment basis / Advance Payment

Marks : As Addressed

Item No.	Description	No. of PCS/ Lots	Weight Carats	Rate per Carat USD	Amount CIF USD
1.	Star Sapphire	2	16.40	250.00	4,100.00
2.	Cat's Eyes	1 Lot	579.81	40.00	23,192.40
3.	Mixed Sapphire	1 Lot	73.10	25.00	1,827.50
4.	Star Sapphire	1 Lot	249.88	5.00	1,249.40
		2 PCS. & 3 lots	919.19		30,369.30

Rate - 01 USD = SL Rs. 150.00

F.O.B. U.S. D.	30,224.30	SL Rs. 4,533,645.00
Insurance	65.00	9,750.00
Air Freight	80.00	12,000.00
Total C.I.F	**30,369.30**	4,555,395.00

Signature of the Company Director,
Company Rubber Stamp

(Please note that only calibrated or below one carat stones can be allowed to be declared as a lot)

National Gem & Jewellery Authority

Gem Testing Laboratory

GEM TESTING RECORD (OVER 10 CTS)

Company: EXG No:

Address: CT No:

Customers Name: Date:

LIST OF THE OVER 10 CTS GEM STONES

Lot No	No of pieces	Variety of Gem stone	Weight (cts)	Colour	Dimensions (mm)	Shape	Description of the inclusions

No of pieces: ……

Total weight: ……

……..

NGJA Officer's Signature

I hereby certify that the details described above are the true and correct & those were recorded in my presence.

Name of the exporter & company: …… Signature:……...

අපනයනයේ අනුගමනය කල යුතු පියවර

❖ **පළමු පියවර** - වාප්පු ලිපිකරුවකු මඟින් ශ්‍රී ලංකා රේගුවේ මැණික් ඒකකයෙන් CT අංකය ලබා ගැනීම. එම අංකය ඉන්වොයිසියේ සඳහන් කළ යුතු අතර එම අංකය ශ්‍රී ලංකා රේගුවේ මැණික් ඒකකයේ Reference Number ලෙස හැඳින්වේ.

❖ **කවුන්ටර අංක 01** - ඉන්වොයිස් පත්‍රිකා භාර දිය යුතු අතර, ඔහු විසින් අධිකාරියේ මැණික් අලෙවි බලපත්‍රය සහ බලපත්‍රයේ තොග සීමාව ආවරණය වන්නේ ද යන්න පරීක්ෂා කර සහතික කර නැවත බාරදෙනු ලැබේ.

❖ **කවුන්ටර් අංක 02** - අඅපනයන අංශයේ නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරයා වෙත අපනයන ඉන්වොයිසිය සහ අපනයනය සඳහා ඉදිරිපත් කරනු ලබන අයිතම පාර්සලය පරීක්ෂාව සඳහා ඉදිරිපත් කළ යුතු ය. එහිදී අපනයන ඉන්වොයිසියේ නිරවද්‍යතාවය පරීක්ෂා කර බලනු ලැබේ. තවද අපනයන ඉන්වොයිසියේ සඳහන් අයිතමයන් වෙන් වෙන් වශයෙන් මැණික් සහ ස්වර්ණාභරණ වර්ගයන් සහ බර සමඟ පරීක්ෂා කර තාවකාලිකව මුද්‍රා තබනු ලැබේ.

❖ **කවුන්ටර් අංක 03** - අධිකාරියේ මැණික් විද්‍යාඥයා / තක්සේරුකරු සහ රේගු මැණික් තක්සේරුකරු විසින් අපනයනකරු හෝ ඔහුගේ/ඇයගේ බලයලත් නියෝජිතයා ඉදිරියේදී අපනයන පාර්සලය පරීක්ෂා කරනු ලැබේ.

❖ මෙහිදී අපනයන ඉන්වොයිසියේ සඳහන් මැණික් සහ ස්වර්ණාභරණ වල නිරවද්‍යතාවය භෞතිකව පරීක්ෂා කරනු ලබන අතර එහි සඳහන් සත්‍ය වටිනාකමට ඌණ හෝ අධි වටිනාකම් සඳහන් කර ඇත්දැයි පරීක්ෂා කරනු ලැබේ.

අපනයනයේ අනුගමනය කල යුතු පියවර

- ✓ පාර්සලය අධිකාරියේ මැණික් විද්‍යාඥයා / තක්සේරුකරු රේගු මැණික් තක්සේරුකරු විසින් සහ අපනයනකරු විසින් නිල මුද්‍රාව තබා සහතික කළ යුතු අතර කඩදාසි වලින් ආවරණය කරන ලද මැණික් / ස්වර්ණාභරණ පාර්සලය ලාකඩ ඉටි වලින් මුද්‍රා තබනු ලැබේ. (මේ සඳහා තමාගේම මුද්‍රා නැඹූ ඇසුරුමක් සහ දුඹුරු කඩදාසි රැගෙන එන ලෙස අපනයනකරුට උපදෙස් දෙනු ලැබේ)
- ✓ කිසියම් අයුරකින් පාර්සලයේ **කෘතිම ගල් ඇති බවට අනාවරණය වුවහොත් සහ ඒවා කෘත්‍රිම ගල් ලෙස ඉන්වොයිසියේ ප්‍රකාශ කර නොමැති බව භෞතික පරීක්ෂාවේ දී අනාවරණය වුවහොත්** අදාල අයිතම අධිකාරිය විසින් රාජසන්තක කරනු ලැබේ.
- ✓ මුද්‍රා නැඹූ පාර්සලය තාවකාලිකව අධිකරිය භාරයේ තබා ගන්නා අතර අධිකාරියේ මැණික් විද්‍යාඥයා / තක්සේරු නිලධාරී සහ රේගු මැණික් තක්සේරු නිලධාරී විසින් සහතික කරන ලද අපනයන ඉන්වොයිසිය කවුන්ටර් අංක 04 සඳහා ඉදිරිපත් කළ යුතු ය. කවුන්ටර් අංක 4 මඟින් අපනයන ඉන්වොයිසිය අංකනය කර අපනයන සේවා ගාස්තු ගණනය සඳහා යොමු කෙරේ.
- ✓ අපනයන සේවා ගාස්තුව ගණනය කිරීම සිදුකරනු ලබන අතර ගණනය කිරීම්හි නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමෙන් අනතුරුව අංකනය කර මුද්‍රා නැඹූ ඉන්වොයිසියේ පිටපත් හතරක් සහකාර අධ්‍යක්ෂ විසින් අපනයනකරු වෙත නිදහස් කෙරේ.
- ✓ අපනයන සේවා ගාස්තුව අයකැමි වෙත පියවීමෙන් අනතුරුව මුද්‍රා තබන ලද අපනයන පාර්සලය අපනයනකරුට නිදහස් කෙරේ.

අපනයනයේ අනුගමනය කල යුතු පියවර

- ✓ රේගු ප්‍රකාශිත පත්‍රිකාව ශ්‍රී ලිකා රේගුව විසින් අනුමත කර අධිකාරියේ අපනයන අංශය වෙත අනුමැතිය සඳහා යොමු කෙරේ.

- ✓ **සීඝ්‍රගාමී හෝ රෙජිස්ටර් තැපෑල** මඟින් ප්‍රවාහනය කරනු ලබන අපනයන පාර්සලය සඳහා රක්ෂණ ආවරණයක් ලබා ගත යුතු ය. මුද්‍රා තැබූ අපනයන පාර්සලය ***පස්වරු 2.00 ට ප්‍රථම*** අධිකාරියේ අපනයන මධ්‍යස්ථානයේ ම පිහිටා ඇති තැපැල් කන්තෝරුව වෙත භාරදිය යුතු ය. (තැපැල් ගාස්තු අයකරනු ලැබේ) රේගු විධිවිධාන අවසන් වූ පසු පාර්සලය ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ තැපැල් කාර්යාලයට නිකුත් කරන තෙක් රේගුව විසින් තබා ගනු ලැබේ. ඒ සඳහා ගුවන් තැපෑල සහ මුද්දර ගාස්තු අපනයනකරු විසින් දැරිය යුතුය.

- ✓ කුරියර් ඒජන්තවරුන් මඟින් ප්‍රවාහනය කරනු ලබන අපනයන පාර්සල් කුරියර් ඒජන්ත නියෝජිතයා වෙත ලබා දිය යුතු අතර එහිදී ගුවන්ගමන් බිල්පත මෙන්ම මැණික් සහ ස්වර්ණාභරණ පාර්සලය ගමනාන්තයට ළඟා වන තෙක් තහවුරු කර ගැනීම සඳහා Tracking Number ලබා ගත යුතුය. (කුරියර් ඒජන්ත ගාස්තු අයකරනු ලැබේ)

- ✓ මුද්‍රා තැබූ අපනයන පාර්සල් අපනයනකරුට නිදහස් කිරීමේ දී, නිකුත් කිරීමේ ලේඛනයේ පාර්සලයේ තොරතුරු ඇතුළත් කළ යුතු ය. සියලුම වැඩ කරන දිනවල ගුවන් තැපැල් පාර්සල් නිකුත් කිරීම සිදු කෙරේ.

අපනයනයේ අනුගමනය කල යුතු පියවර

- ***අතේ රැගෙන යන මුද්‍රා තැබූ අපනයන පාර්සල් වලට අදාලව***

අධිකාරියේ අපනයන විසින් අපනයනයට අදාළ සියලුම ලියකියවිලි පරීක්ෂා කර ශ්‍රී ලංකා රේගුව වෙත මුදා හරිනු ඇති අතර මුද්‍රා තැබූ අපනයන පාර්සලය විශේෂිත ආරක්ෂිත රථ මඟින් බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි (කටුනායක) රේගු අංශය වෙත භාර දෙනු ලැබේ. මුද්‍රා තැබූ අපනයන පාර්සලය දරන්න විසින් අනන්‍යතාවය තහවරු කරගැනීමෙන් අනතුරුව මුද්‍රා තැබූ අපනයන පාර්සලය මුදා හරිනු ලැබේ.

ජාත්‍යන්තර මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රදර්ශන සඳහා මැණික් / ස්වර්ණාභරණ අපනයනය සඳහා පහසුකම් සැලසීම - ප්‍රදර්ශන කාණ්ඩය (EXG/EXJ)

❖ප්‍රදර්ශන අපනයන සඳහා සේවා ගාස්තු සහනය (SFW) අයදුම් කිරීමේ ක්‍රියාපටිපාටිය

❖ජාත්‍යන්තර ප්‍රදර්ශනවලට සහභාගිවන්නන් සඳහා අපනයන සේවා ගාස්තු සහනයක් අයදුම් කළ හැක. මේ සඳහා අපනයනකරු විසින් අපේක්ෂිත අපනයන දිනයේ සිට වැඩකරන දින හතකට පෙර (07) අපනයන සේවා සහ අපනයන අලෙවි අධ්‍යක්ෂ වෙත විධිමත් ලිඛිත ඉල්ලීමක් කළ යුතුය.

❖මේ සඳහා මූලාශ්‍ර ලියවිලි ලෙස ප්‍රදර්ශන සංවිධායක විසින් නිසි පරිදි අත්සන් කරන ලද වෙළෙඳ කුටි කොන්ත්‍රාත්තුව, ප්‍රදර්ශන කුටියේ ගෙවීම් කුවිතාන්සිය සහ ප්‍රදර්ශන සංවිධායක විසින් කරන ලද ආරාධනය අමුණා තිබිය යුතුය.

❖මෙම පූර්ව අපනයන සේවා ගාස්තු නිදහස් කිරීම ඉහත ලියකියවිලි මත පදනම්ව ප්‍රදානය කෙරේ. අපනයන සේවා ගාස්තු නිදහස් කිරීම සඳහා ලබා දී ඇති සහන කාලය අපනයනය කළ දින සිට උපරිම දින 180 කි.

❖පරිපාලන අයකිරීම් ලෙස රු.15 000/- මුදලක් අය කරනු ලැබේ.

❖මෙසේ අපනයනය කරන ලද මැණික් හා ස්වර්ණාභරණ පාර්සලයක් නැවත රට තුළට රැගෙන එන විට අපනයනකරු අපනයනය කරන ලද ශාඛාවෙන්ම පාර්සලය නිදහස් කර ගත යුතුය. ඔහු / ඇය අපනයනය කරන ලද පාර්සලයේ විකුණුම් විස්තරය ඉදිරිපත් කළ යුතුය. මෙම පාර්සලය ශ්‍රී ලංකා රේගුවේ මැණික් තක්සේරු නිලධාරීන් සහ අධිකාරියේ තක්සේරු නිලධාරීන් විසින් පරීක්ෂා කරනු ලැබේ.

ජාත්‍යන්තර මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රදර්ශන සඳහා මැණික් / ස්වර්ණාභරණ අපනයනය සඳහා පහසුකම් සැලසීම - ප්‍රදර්ශන කාණ්ඩය (EXG/EXJ) දිගුව

- ප්‍රකාශිත විකුණන ලද අයිතම මත පදනම්ව සේවා ගාස්තු ගණනය කෙරේ. විකුණන ලද අයිතමවල FOB අගය මත 0.25% ක සේවා ගාස්තුවක් අය කෙරේ. කෙසේ වෙතත් විකුණන ලද අයිතමවල FOB අගය මත 0.25% ක සේවා ගාස්තුවේ වටිනාකම රුපියල් 15,000/- ක පෙර ගාස්තුව නොඉක්මවන්නේ නම් අමතර ගාස්තුවක් අය නොකෙරේ.
- විකුණන ලද අයිතමවල FOB අගය මත 0.25% ක සේවා ගාස්තු වටිනාකම පෙර අයකරන ලද රුපියල් 15,000/- ක පරිපාලන ගාස්තුව ඉක්මවන්නේ නම්, අගයන් අතර වෙනස අය කෙරේ. (සැබවින්ම ගෙවිය යුතු ගාස්තු වලට සාපේක්ෂව රු. 15,000/- ක් කපා හැරීනු ලබයි)
- සම්පූර්ණ ප්‍රතිලාභ හෝ සැබෑ ගාස්තු රු. 15,000/- ට අඩු නම්, පෙර අයකරන ලද පරිපාලන ගාස්තුව වන රු. 15,000/- ක මුදල නිදහස් කිරීමක් සිදුකරනු නොලැබේ.
- සහන කාලය අවසන් වීමට පෙර, විකිණූ භාණ්ඩ ඉදිරිපත් කිරීමට, නිවැරදිව ප්‍රකාශ කිරීමට හෝ එම මැණික් /ස්වර්ණාභරණ පරීක්ෂාවටඉදිරිපත් කිරීමට අපනයනකරුවන් අපොහොසත් වුවහොත් අධිකාරිය විසින් ඉන්වොයිස් අගය මත 0.25% ක අපනයන සේවා ගාස්තුව අයකර ගනු ඇත.

පුද්ගලික මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රදර්ශන සඳහා මැණික් සහ ස්වර්ණාභරණ අපනයනය සඳහා පහසුකම් සැලසීම – ආදර්ශන කාණ්ඩය (EXG – D/ EXJ – D)

- මෙම වර්ගීකරණය යටතේ සිදුකරනු ලබන අපනයනයන් සඳහා අපනයන සේවා ගාස්තු සහනය ප්‍රදානය කරනු ලබන්නේ අපනයනය කරනු ලබන මැණික් / ස්වර්ණාභරණ තොගයේ 0.5% ක සේවා ගාස්තුව ආවරණය වන පරිදි මුදල් තැන්පතු හෝ බැංකු ඇප්පකරයක් ලබාදීමෙන් පමණකි .
- තොග අපනයනය සඳහා ලබා දී ඇති අපනයන සේවා ගාස්තු සහනය පියවීම සඳහා ලබා දී ඇති සහන කාලය අපනයනය කළ දිනයේ සිට උපරිම වශයෙන් දින 180කට සීමා වේ.
- අධිකාරිය විසින් එවැනි අපනයන සඳහා රුපියල් 15,000/- ක ආපසු නොගෙවන පරිපාලන ගාස්තුවක් අය කරනු ලැබේ.
- අපනයන ඉන්වොයිසියේ FOB අගයේ ප්‍රකාශිත විකුණන ලද අයිතම වලින් 0.5% ක් අපනයන සේවා ගාස්තුව ලෙස අය කෙරේ.
- අපනයනය කළ දින සිට දින 180ක් ඇතුළත අදාළ අපනයන ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ඉන්වොයිසියේ FOB අගයෙන් 1%ක් අපනයන සේවා ගාස්තු ලෙස අය කෙරේ.
- අපනයනය කරන ලද සම්පූර්ණ තොගය නොවිකිණී ආපසු රැගෙන එන විට ඒ සඳහා - රු. 3,000/- ක ගාස්තුවක් අය කෙරේ.

ජාත්‍යන්තර රසායනාගාර වාර්තා ලබාගැනීම සඳහා වූ අපනයනයන් සඳහා පහසුකම් සැලසීම (PCGE – T)

❖රසායනාගාර වාර්තා ලබාගැනීම සඳහා වූ අපනයනයන් සඳහා පහසුකම් සළසනු ලබන්නේ, පිළිගත් නම් කරන ලද රසායනාගාරයක් සඳහා පමණක් අවසර ලබා දෙනු ඇත.

❖මේ සඳහා අපනයනකරු විසින් අපේක්ෂිත අපනයන දිනයේ සිට වැඩකරන දින හතකට පෙර (07) අපනයන සේවා සහ අපනයන අලෙවි අධ්‍යක්ෂ වෙත විධිමත් ලිඛිත ඉල්ලීමක් කළ යුතුය.

❖අපනයනකරු විසින් රසායනාගාරයේ නම සහ ලිපිනය දැක්වෙන ලෙස අපනයන ඉන්වොයිසිය සකස් කළ යුතු අතර ගුවන් මාර්ග බිල්පත ඉදිරිපත් කළ යුතුය.

❖එක් එක් රසායනාගාර සහතික අපනයනය සඳහා ලබා දී ඇති පියවීම් කාලය අපනයනය කළ දින සිට උපරිම වශයෙන් දින 180කට සීමා වේ.

❖ජාත්‍යන්තර රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබාගැනීම සඳහා අපනයනය කරන එක් මැණික් ගලක් සඳහාම රු.1000/- (දහසක්) පරිපාලන ගාස්තුවක් අය කෙරේ.

අපනයන සේවා ගාස්තු සහනය ලබාගෙන අපනයනය කරන ලද මැණික් සහ ස්වර්ණාභරණ නොවිකිණ ආපසු පැමිණීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය

- ✓අධිකාරියේ මැණික් තක්සේරු නිලධාරියෙකුගේ සහ අපනයන අංශයේ සහකාර අධ්‍යක්ෂවරයාගේ පරීක්ෂාව සඳහා අනිවාර්යයෙන් ඉදිරිපත් කර පරීක්ෂාව සඳහා ඉදිරිපත් කළ බවට සහතික කරවා ගත යුතු ය.
- ✓ජාත්‍යන්තර රසායනාගාර වාර්තා ලබාගැනීමේ අපේක්ෂාවෙන් අපනයනය කරනු ලබන මැණික් නැවත පැමිණෙන අවස්ථාවේ දී, අපනයනකරු විසින් ලබාගන්නා ලද රසායනාගාර සහතිකවල මුල් පිටපත, පිටපතක් සමඟ ඉදිරිපත් කළ යුතු ය. මුල් වාර්තාවේ පිටපතක් බව සහතික කරගැනීමෙන් අනතුරුව මුල් වාර්තාව නිදහස් කරනු ලැබේ.
- ✓අපනයනය කරන ලද පාර්සලය නැවත පැමිණීමේ දී රසායනාගාරය අපනයනකරු ලෙසත් තොගකරු ආනයන කරු ලෙසත් දැක්වෙන මුල් අභ්‍යන්තර ගුවන් මාර්ග බිල්පත ඉදිරිපත් කිරීම ද සිදුකළ යුතු ය.
- ✓ජාත්‍යන්තර රසායනාගාර වාර්තා ලබාගැනීමේ අපේක්ෂාවෙන් අපනයනය කරනු ලබන මැණික් නැවත පැමිණෙන අවස්ථාවේ දී, අපනයනකරු විසින් අපනයනය සඳහා ඉදිරිපත් කරන ලද මැණික් ම ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් අධිකාරිය විසින් සම්පූර්ණ අපනයනය කරන ලද තොගයේ F.O.B අගයෙන් 1% ක් ගාස්තුවක් ලෙස අය කරනු ලැබේ..
- ✓ඉහත කොන්දේසි වලට අනුකූල නොවන අපනයනකරුවන් සඳහා ඉදිරියේ දී අපනයන සේවා ගාස්තු සහන/ නිදහස් කිරීම් ලබා නොදෙනු ඇත.

ATA Carnet යනු කුමක්ද?

- **ATA stands for Admission – Temporaries – Admission.**

- **ATA Carnet** යනු **ATA** සම්මුතියේ සඳහන් භාණ්ඩ ඵලදායී ලෙස අපනයනය කිරීමට සහ තීරුබදු රහිතව ආනයනය කිරීමට හැකි වන පරිදි සකසන ලද ජාත්‍යන්තර රේගු ලේඛනයක් වේ. කෙසේ වෙතත්, අපනයනකරුට විකිණීමක් සිදු වුවහොත්, එම භාණ්ඩ විකිණීම සඳහා අදාළ ආනයන බදු අදාළ රට තුළ සිදු කරනු ලැබුවහොත් එය විකිණීම තහනම් නොවේ.

- **ATA Carnet** වෙතින් ප්‍රතිලාභ ලැබිය හැකි පාර්ශවයන් ? **Carnet** භාවිතා කරන්නා ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වූ පුද්ගලයෙකු හෝ සමාගමක් විය හැක.
  - සංචාරක ව්‍යාපාර / විකුණුම් විධායක.
  - කාර්මික ශිල්පීන්
  - චිත්‍රපට කාර්ය මණ්ඩලය, ශල්‍ය වෛද්‍යවරුන්, ගෘහ නිර්මාණ ශිල්පීන්, කලාකරුවන්, ඉංජිනේරුවන්, අධ්‍යාපනඥයින්, විනෝදාස්වාද කරන්නන් වැනි සාධාරණ ප්‍රදර්ශකයින් සහ වෘත්තීය පුද්ගලයින් සහ කණ්ඩායම්. වෙනත් ඕනෑම පුද්ගලයෙකුට **Carnet** භාවිතා කිරීමට අවශ්‍ය නම්, ඔහු/ඇය **Carnet** දරන්නාගෙන් ලිපියක් ඔහු/ඇය වෙනුවෙන් රැගෙන ආ යුතුය.

- **ATA Carnet** පද්ධතිය යටතේ සුදුසුකම් ලබන භාණ්ඩ
  - සාම්පල සඳහා . තාවකාලික වටිනාකම්
  - වෘත්තීය උපකරණ අපනයනය
  - භාණ්ඩ, ප්‍රදර්ශන හෝ වෙළඳ ප්‍රදර්ශන සඳහා ඉදිරිපත් කිරීම.

Issuing Authority In Sri Lanka, International Chamber of Commerce Sri Lanka (ICC Sri Lanka)

International Chamber of Commerce Sri Lanka (ICC Sri Lanka)
Suncity Building, Unit 2B/2/2,
St. Anthony's Mawatha,
Colombo 03, Sri Lanka

Chief Operating Officer
+94 11 583 3392

info@iccsrilanka.com

Website - www.iccsl.lk

අපනයන මධ්‍යස්ථාන නිලධාරීන් සම්බන්ධ විස්තර

- ජී. ඩබලිව් අමරසිරි මහතා - අධ්‍යක්ෂ (ES&EM), ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

  ටෙලි (Dir) – 0112337693 / (ජංගම) - +94716845296

- රංග වනසිංහ මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (ES&EM), ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

  ටෙලි (Dir) – 0112337693 / (ජංගම) - +94713833980

- අචලා පෙරේරා මහත්මිය - සහකාර අධ්‍යක්ෂ (ES&EM), ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය


  ටෙලි (Dir) – 0112390654/ (ජංගම) - +94711236673


- අනෝමා වෙරළුපේ මෙය - නියෝජ්‍ය අධ්‍යක්ෂ (ES&EM), ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

  ටෙලි (Dir) - / (ජංගම) - +94712832218

- ශානක කරුණාරත්න මහතා - අපනයන නිළධාරී ජංගම - +94072385591


like us on
facebook


Mobitel
Dialog
4:26
78
National Gem and Jewe...
NATIONAL GEM &
JEWELLERY AUTHORITY
NGJA
JEWELLERY AUTHORITY
National Gem and Jewellery Authority
Promote
Add to story
Manage
Posts
About
Videos
More
Details
Page · Government organization


Mobitel
Dialog
4:26
Ngja SriLanka
9+
JEWELLERY AUTHORITY
Ngja SriLanka
National Gem & Jewellery Authority
Publicity Unit
Government Organization
Add to story
Edit profile
What's new, Ngja?
Let's update some profile info that may have changed.
Not now
Update profile
Works at National Gem & Jewellery

ස්තූතියි

අපනයන ප්‍රවර්ධන අංශයේ
ප්‍රයත්නයක්

දු. අ. 0112390653

වි. තැ. promotion@ngja.gov.lk;
ngjaexportpromotion@gmail.com